වෛද්‍ය විද්‍යාව

## වෛද්‍ය ඉතිහාසයේ පෙරළියක් ඇති කරන

# උපදේශන යන්ත්‍ර

දිනෙන් දින පෙරට පා තබන නව තාක්ෂණ පෙරළිය හේතුවෙන් මිනිස් සම්බන්ධතා ක්‍රමයෙන් දුරස් වීමටත්, ඒ වෙනුවට සිත් පිත් නැති යන්ත්‍ර සූත්‍රවල සහය පැතීමටත් වත්මන් මිනිසා පෙළඹී ඇත. මෙම නවතම තාක්ෂණ පෙරළිය හේතුවෙන් වෛද්‍යවරයා සහ රෝගීන් අතර සමීප සම්බන්ධතාව ක්‍රමයෙන් දුරස්වන බව පර්යේෂකයන් සඳහන් කරති.

ඔබේ ශරීරයේ කොලෙස්ටරෝල් ප්‍රමාණය, රුධිර පීඩනය හා පිළිකා ගැටිතිවල මූලික ලක්ෂණ සොයා උපදේශන යන්ත්‍රයක් මගින් නිවසේදී ම ඔබට පරීක්ෂා කරගත හැකිනම් එය කොපමණ අගනේ ද? එම පරීක්ෂා මගින් රෝගී තත්ත්වය, ගතයුතු ඖෂධ වර්ග හා පිළිපැදිය යුතු උපදෙස් විදහා දැක්වීම වෛද්‍ය විද්‍යාවේ නවතම ප්‍රගතියක් ලෙස හඳුන්වා දිය හැක. මෙහිදී සොයා ගැටලු වලදී රෝගියා තමන්ගේ ම හවුල්කාරයා වන අතර ආරම්භක අවදියේ පවතින රෝග නිධානයන් දැනගෙන ඒ අනුව ප්‍රතිකාර ලබා ගැනීමටත් රෝගියාට අවස්ථාව ලැබේ. නිදසුනක් ලෙස ඔබේ ශරීරයේ කොලෙස්ටරෝල් ප්‍රමාණය දැන ගැනීමට අවශ්‍ය වූ විට... පළමුව ඇඟිලි තුඩුවෙන් ලේ බිඳුවක් හෝ දෙකක් පරීක්ෂණ තීරුව මතට හෙළන්න. විනාඩි 15 කට පමණ පසු එහි වර්ණය වෙනස් වන අතර එමගින් ඔබේ ශරීරයේ කොලෙස්ටරෝල් ප්‍රමාණය විදහා පෙන්වයි. කොලෙස්ටරෝල් ප්‍රමාණය හොඳ මට්ටමක පවතී නම් (HDL) එච්. ඩී. එල් නමින් ද අසතුටුදායක තත්ත්වයක පවතිනම් (LDL) එල්. ඩී. එල් නමින් හා ඒ සඳහා ගත යුතු ප්‍රතිකාර හා උපදෙස් මෙම යන්ත්‍රය විදහා පායි.

වෛද්‍ය විශේෂඥයන් සඳහන් කරන පරිදි ඇමරිකාවේ දැනට මෙවන් රෝග නිධාන පිළිබඳ පරීක්ෂා කරන නිවැසියන්ගේ සංඛ්‍යාව 30% පමණ වන අතර, වසර 2000 වන විට එය 50% ක් දක්වා ඉහළ යනු ඇත. එපමණක් නොව වසර 2002 වන විට මෙම තත්ත්වය දෙගුණවනු ඇතැයි පරීක්ෂකයන් අපේක්ෂා කරති.

වසර 20 කට පමණ පෙරාතුව මෙවන් පරීක්ෂණ වෛද්‍ය විශේෂඥයන් විසින් පරීක්ෂාගාරවලදී සිදුකරන ලදී. එහිදී රෝගියාට පරීක්ෂණයට භාජනය වීමට, ප්‍රතිඵල ලබා ගැනීමට දිගු වේලාවක් සිටීමට සිදු විය. නමුත් මෙවන් වෛද්‍ය උපදේශනයක් තුළින් විද්‍යාමාන වන කරුණු සරල, නිවැරදි හා කාර්යක්ෂමතාව හේතුවෙන් එය බොහෝ නිවැසියන් අතර ජනප්‍රිය වී ඇත.

මෙවන් උපදේශන යන්ත්‍ර රෝගියාගේ වගකීම් දුරීමට සහය වන බව පර්යේෂකයන් සඳහන් කරයි. එමගින් සොයා කටයුතු සඳහා යන වියදම අඩුවීම, කාලය ඉතිරිවීම හා මෙමගින් විදහාපාන ප්‍රතිඵල අනුව ප්‍රතිකාර ගැනීමට හැකිවීම ඉන් සමහරකි. 1979 සිට ඇමරිකාවේ ආහාර හා ඖෂධ පරිපාලකය විසින් මෙවන් උපදේශන යන්ත්‍ර 300 ක් පමණ හඳුන්වා දී ඇත. වර්තමානයේ බහුතර පිරිසකගේ කුතුහලය දනවන ප්‍රධාන කරුණු අතර, ප්‍රධාන තැනක් ගන්නේ දියවැඩියාව, ගර්භණීභාවය (පිළිසිඳ ගත් දින හරියටම දැනගැනීමට) හා ඒඩ්ස් රෝගය යි. මෙහිදී මෙම යන්ත්‍රය මගින් ලබාදෙන උපදෙස් පිරිදි පරීක්ෂාකාරීව ක්‍රියා කළ යුතු බව පර්යේෂකයන් සඳහන් කරන අතර, එසේ නොකිරීමෙන් වැරදි ප්‍රතිඵල ලැබිය හැකි බව අවධාරණය කරති. එමෙන්ම ඔබ නිවැරදි උපදෙස් භාවිත කළහොත් මෙම පරීක්ෂණයන් නිවැරදි වන බව වෛද්‍ය ක්ලැමෝ සඳහන් කරයි.

මෙම පරීක්ෂණයන් හා නිගමනයන් නිසි පරිදි අනුගමනය කිරීමෙන් ඔබේ ජීවිතය ද ආරක්ෂා වේ. එපමණක් නොව, යම් පරීක්ෂණයකින් ඔබ සෑහීමකට පත් නොවූන හොත්, එය නැවත නැවතත් කිරීමටත් සැකයක් පවතී නම් ඔබේ වෛද්‍යවරයා ලවා සහතික කරගැනීමටත් ඔහු උපදෙස් දෙයි. ගර්භණී පරීක්ෂණයකදී අපරීක්ෂාකාරීව තොරතුරු ලබා ගත් එක් කාන්තාවක් මත්පැන් පානය හා දුම්බීම දිගින් දිගටම කරගෙන ගිය අතර පසුව ඇයගේ දරුගැබ විනාශවීම මෙයට නිදසුනක් ලෙස සඳහන් කළ හැක.

ඇමරිකානු වෛද්‍ය සංගමය සඳහන් කරන පරිදි මෙවන් වෛද්‍ය උපදේශන යන්ත්‍ර විශේෂඥවරයකුගේ කාර්යාලයක් තුළදී ම භාවිත කරනවානම්, ඔහුගේ අනුමැතිය හා උපදෙස් පහසුවෙන් ලබාගත හැකි බව සඳහන් කරයි. ඒ මන්දයත් නිවසේදී පරීක්ෂා කළත් අනිවාර්යයෙන් ම වෛද්‍යවරයකුගේ අනුමැතිය ලබා ගැනීමට යායුතු හෙයිනි. එමෙන් ම, වෙනත් අයකු මාර්ගයෙන් රෝග විනිශ්චය කර ගැනීමේදී ඇතිවන තවත් වාසියක් නම් රෝගියාගේ කලබලකාරීබව, කුතුහලය ඇති නොවීම යි.

වයස අවුරුදු 50 දී එක් කාන්තාවකට අධික රුධිර පීඩනය ඇති වුනි. ඒ අනුව ඇය මෙවන් වෛද්‍ය උපදේශන යන්ත්‍රයක් මිලදී ගෙන නොකඩවා එහි උපදෙස් පිළිපදින්නට විය. එහෙත් පසුකාලයකදී එහි උපදෙස් ලබාගැනීමට ඇයට අවකාශයක් නොවී ය. එයට හේතු වූයේ ඇයගේ දරුවන් නිතරම ඇය පිළිබඳ අවධානයෙන් පසුවීම නිසා මෙම උපදේශන යන්ත්‍රය භාවිත කිරීමට අපහසු වීමයි. එනම්, ඇයගේ රෝගී තත්ත්වයන් දැනගෙන දරුවන් කණගාටුවනවා දැකීමට ඇය අකමැති වීම යි. මෙහිදී වෛද්‍ය ක්ලැමෝ පවසන්නේ බොහෝ පුද්ගලයින් තමන්ගේ ශරීරයේ පවත්නා රෝගී තත්ත්වයන් නව අයකු දැනගන්නවාට තදින් ම අකමැති බව යි. එවන් අය තමන්ගේ රෝගී තත්ත්වයන් අන් අයගෙන් වසන් කරති. එහෙත් අධික රුධිර පීඩනය වැනි රෝගී තත්වයන් පිළිබඳ පරීක්ෂාකාරී නොවීමෙන් හෘදයාබාධ වැනි භයානක රෝගී තත්ත්වයන් ඇති විය හැක.

එමෙන් ම, සමාජ රෝග සඳහා උපදෙස් ලබා ගැනීමේදී මෙම උපදේශන යන්ත්‍රය රහස්‍යභාවය මනා ලෙස සුරකියි. නිදසුනක් ලෙස ඒඩ්ස් රෝගය පරීක්ෂා කිරීමේදී අනෙකුත් පරීක්ෂණයන් මෙන් නිවසේදී ම ප්‍රතිඵල ලබා නොදේ. මෙයට පරීක්ෂාගාර සහය අත්‍යාවශ්‍ය වේ. HIV වෛරසය තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා ඔබේ පෞද්ගලික රහස්‍යභාවය සුරැකෙන පරිදි සෑම වෛද්‍ය උපදේශන යන්ත්‍රයක් සඳහාම සෑම පුද්ගලයකු වෙනුවෙන් ම රහස්‍ය අංක ඇතුළත් කර ඇත. මෙය භාවිත කරන්නා පළමුව ලේ බිඳු කිපයක් පරීක්ෂණ තීරුව මතට හෙළා එය හොඳින් වියළීමට තැබිය යුතු වෙයි. පසුව එයට මුද්‍රා තබා පරීක්ෂණාගාරයට යවා සතියකට පසු ඔබේ රහස්‍ය අංකය භාවිත කරමින් හඬ කවන ලද පණිවිඩයක් මගින් ප්‍රතිඵල දැනුම් දෙයි. මේ අනුව සැලකීමේදී, නව සියවසේ ඔබේ වෛද්‍යවරයා ඔබේ නිවසට පැමිණෙන දිනය වැඩි ඈතක නොවේ.

**පරීක්ෂණය සාර්ථක කර ගැනීමට කරුණු 10 ක්**

1) ඔබ බෙහෙත් මිලදී ගැනීමේදී, පළමුව භාවිතයට සුදුසු කාල වකවානුව පරීක්ෂා කරන්න. දින ඉකුත්වූ බෙහෙත් දිගු කාලයක් ක්‍රියාකාරීත්වයේ නොපවතී.

2) නිතර උෂ්ණත්වය වෙනස් වන තැන්වල බෙහෙත් ද්‍රව්‍ය තැබීමෙන් වලකින්න.

3) බෙහෙත් අසුරනයේ ඇති උපදෙස් පරිදි ක්‍රියා කරන්න.

4) එම බෙහෙත් ද්‍රව්‍ය භාවිත කරන පිළිවෙල එහි ඇති උපදෙස් රූප රාමු පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගන්න.

5) කිසියම් දෙයක් පිළිබඳ ඔබට අපැහැදිලි තත්වයක් පවතී නම් අනුමාන කිරීමට නොයන්න. වහාම ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

6) උපදෙස් නිසි පරිදි පිළිපදින්න. ඒවා අතපසු නොකරන්න.

7) බෙහෙත් භාවිතා කිරීමට වේලාවක් දී තිබේනම් ඒ පිළිබඳ සැලකිලිමත් වන්න.

8) පරීක්ෂණය වර්ණය මත රඳා පවතී නම්, ඔබ වර්ණ අන්ධතාවෙන් පෙළෙන්නෙක් නම්, තවත් අයෙකුගේ උපකාරය ලබාගන්න.

9) ඔබේ පරීක්ෂණය ගැන සැකයක් මතුවුනි නම් වහාම ඔබේ වෛද්‍යවරයා/ විශේෂඥවරයා හමුවන්න.

10) ඔබ භාවිතා කරන බෙහෙත් ද්‍රව්‍ය කුඩා ළමුන්ගෙන් ඈත් කර තබන්න.

'ද රොටේරියන්' ඇසුරිනි.

**ප්‍රියන්ති තිරාණගම**